

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# කාර්යය සාධන වාර්තාව 2020



**"ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි"**

---


**පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**
අංක 244, කටුගස්තොට පාර, මහනුවර.

දු.ක. : 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් : info@revenue.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenue.cp.gov.lk

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත)

## 1. හැඳින්වීම

### 1.1. දැක්ම

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

### 1.2. මෙහෙවර

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

### 1.3. අරමුණු හා කාර්යයන්

**අ)** ආදායම් ඉලක්ක සපුරා ගැනීම

1. 2020 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1550 ක් එකතු කිරීම
2. පවතින හිග පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 0.5ක් එකතු කිරීම
3. ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 4ක් එකතු කිරීම
4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම් රැස්කිරීම

**ආ)** නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

**ඇ)** වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

**ඈ)** තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය

**ඉ)** තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

**ඊ)** යහපාලනය

## 1.4. මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ගැන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන්වන සංශෝධනය මඟින් පළාත් සභාව නම් වූ පරිපාලන ඒකකය ආරම්භ වූ අතර, මෙම පළාත් සභාවන් හී ආදායම් කටයුතු සම්බන්ධ කාර්යභාරයන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 36 වන වගන්තිය යටතේ 36:1 සිට 36:20 දක්වා ඇති උප වගන්ති මගින් පළාත් සභාවන්ට අදාල වූ ආදායම් ප්‍රභවයන් හඳුන්වා දී ඇත. ඉහත නෛතික විධිවිධානයන්ට අනුකූලව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්මත කර ගන්නට යෙදුණු 1990 අංක 17 දරණ මුදල් ප්‍රඥප්තියේ නෛතික රාමුව තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

ඉහත කී මුදල් ප්‍රඥප්තිය මගින් හා 1996 අංක 03 දරණ මධ්‍යම පළාත් මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනයට යටත්ව බදු හා ගාස්තු මෙන්ම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු බදු හා ගාස්තු වර්ග දක්වමින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හඳුන්වා දී ඇත. පහත සඳහන් ආදායම් ශීර්ෂ මෙම ප්‍රඥප්ති මගින් දක්වා ඇත.


- පිරිවැටුම් බද්ද
- මුද්දර ගාස්තුව
- ඔට්ටු බද්ද
- ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද
- මෝටර් ප්‍රවාහන පනත යටතේ ගාස්තු දණ්ඩන හා බලපත්‍ර ගාස්තු
- අධිකරණ දඩ හා ගාස්තු
- මධ්‍යම පළාත් ලොතරැයි පිළිබඳ බදු
- ඉඩම් හා ගොඩනැගිලි බද්ද
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් සඳහා ගාස්තු
- සුරාබදු ආදායම
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු
- පඩි හා මිම් ආඥාපනත යටතේ ගාස්තු
- තෑගි තරග බද්ද

වර්තමානයේ පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන බදු හා ගාස්තු

1. පිරිවැටුම් බද්ද -1991 සිට 2010 (4) කාර්තුව දක්වා වූ හිඟ පිරිවැටුම් බදු පමණි.
2. මුද්දර ගාස්තු - 1991 සිට ක්‍රියාත්මක වේ.
3. ඛණිජ අයිතීන් පිළිබඳ බද්ද - 2014 (2) කාර්තුවේ සිට ක්‍රියාත්මක වේ.
4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ගාස්තු - 2015 නොවැම්බර් සිට ක්‍රියාත්මක වේ.

1.5.

**සංවිධාන ව්‍යුහය - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**



## 1.6. කාර්ය මණ්ඩල තොරතුරු

2020-12-31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව හා සටින සංඛ්‍යාව

| තනතුර | අනුමත සංඛ්‍යාව | වැ කේ | සිටින සංඛ්‍යාව | සෘජු බඳවා ගැනීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| නියෝජ්‍ය ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 (වැ.බ.) | |
| තක්සේරුකරු | 14 | SL-1 | 12 | පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු හෝ 2වන පන්තියේ උපාධියක් / වරලත් හෝ එකාබද්ධ ගණකාධිකාරීන් |
| බදු නිලධාරී | 22 | MN-5 | 19 | පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්, / වරලත් ගණකාධිකාර ආවසරික2/ CIMA 3වන මට්ටම |
| සංවර්ධන නිලධාරී | 12 | MN-4 | 11 | |
| රා.කළමනාකරණ සහකාර | 6 | MN-2 | 6 | |
| රියදුරු | 3 | PL-III | 3 | |
| කාර්යාල කාර්ය සහායක | 4 | PL-I | 3 | |
| | | | | |
| **එකතුව** | **63** | | **56** | |

ඉහත සටහනේ දැක්වෙන පුරප්පාඩු තනතුරු වලට නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන මෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කර ඇති අතර මෙතෙක් බඳවාගැනීම් සිදුකර නැත.

## 2. 2020 වර්ෂයේ සැලසුම් කරන ලද කාර්යයන් හා ඉටුකළ කාර්යයන්


### 2020 වර්ෂය තුළදී අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය

| ආදායම් ප්‍රභවය | | වාර්ෂික ආදායම් ඉලක්කය රුපියල් | 2020 වර්ෂය තත්‍ය ආදායම රුපියල් | ළඟා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉලක්කය | 1,000,000,000<br>1,550,000,000 | 1,392,079,613<br>1,392,079,613 | **139%**<br>**90%** |
| 02 | හිග පිරිවැටුම් බදු | 500,000 | 1,434,800 | **287%** |
| 03 | බනිජ අයිතීන් පිළිබඳ බද්ද<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉලක්කය | 2,000,000<br>4,000,000 | 2,878,811<br>2,878,811 | **144%**<br>**72%** |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>• බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉලක්කය | 3,000,000<br>2,800,000 | 3,656,000<br>3,656,000 | **122%**<br>**130%** |
| 05 | වෙනත් ආදායම්<br>මත ලබාදීමේදී අය කරන ගාස්තු | - | 213,550 | |
| | **එකතුව**<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉලක්කය | 1,005,000,000<br>1,557,300,000 | 1,400,262,774<br>1,400,262,774 | **139%**<br>**90%** |

## 2020 වර්ෂයේ ඉටුකළ කාර්යයන්

### අ) 2020 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1392 ක් එකතු කිරීම

රටේ පැවති අස්ථාවර දේශපාලනික හා ආර්ථික වාතාවරණය නිමාවට පත් කරමින් 2020 වසර උදා වුව ද කොවිඩ්19 ගෝලීය වසංගතයේ බලපෑම රටේ ආර්ථිකය කෙරෙහි අයහපත් ලෙස බලපා ඇත. කොවිඩ් ව්‍යාප්තිය හමුවේ වරින් වර රට වසා දැමීමට සිදුවීම, දෛනික ජන ජීවිතයට දැඩි ලෙස බලපෑ අතර දේපල හුවමාරු වීම් වල ද විශාල පසුබෑමක් සිදුවී ඇත. සංචාරක ව්‍යාපාරය අරමුණු කරගනිමින් නුවරඑළිය, මහනුවර හා දඹුල්ල නගර ආශ්‍රිතව අසාමාන්‍ය වටිනාකම් වලින් සිදුවූ දේපල හුවමාරුවීම් මුද්දර ගාස්තු ආදායමේ වර්ධනයට වැඩි දායකත්වයක් දැක්වූ අතර කොවිඩ්19 ගෝලීය වසංගතය හමුවේ මෙරටට සංචාරකයන් ගෙන්වීම නතර කිරීම, සංචාරක ව්‍යාපාරය අරමුණුකරගත් දේපල හුවමාරුවීම් වල පසුබැසීමට හේතුවී ඇත. පවත්නා නිරෝධායන නීති යටතේ බදුගෙවන්නන් සම්මුඛ සාකච්ඡා කැඳවීම, දේපල ස්ථාන සමීක්ෂණය කිරීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ආදී රාජකාරි කටයුතු දැඩි ලෙස සීමා කිරීම් මධ්‍යයේ වුවද 2020 වසරේ දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්කගත ආදායම 90%කින් සපුරා ගනිමින් රු. 1,392,079,613.00ක ආදායමක් රැස්කර දීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. එය පළාත් අයවැයෙන් ලබාදුන් ආදායම් ඉලක්කය වූ රු. 1,000,000,000ට සාපේක්ෂව 139%ක වර්ධනයකි. 2020 වසර තුල නිලධාරීන්ගේ සෘජු මැදිහත්වීම මත එකතුකරන ලද අතිරේක මුද්දර ගාස්තු ප්‍රමාණය රු. 60,633,175.00කි. කොවිඩ්19 වසංගතය හමුවේ රට නව සාමාන්‍යකරණයට අනුගත වෙමින් පවතින වාතාවරණයක් තුළ, රටේ දේශපාලන ස්ථායීතාවය හා සංවර්ධනය අරමුණු කරගත් ආර්ථික ප්‍රතිපත්ති අනුව, ඉදිරි වසර කිහිපය තුල මුද්දර ගාස්තු ආදායමේ සාධනීය වර්ධනයක් ඇතිවනු ඇතැයි බලාපොරොත්තු විය හැක.




**2.1 රූප සටහන**
**2011 සිට රැස්කරන ලද මුද්දර ගාස්තු ආදායම**

### ආ) පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 0.5ක් එකතු කිරීම

මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2011 අයවැය යෝජනා මගින් පිරිවැටුම් බද්ද අත්හිටුවීම නිසා වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිඟ හිටි බදු පමණක් අයකර ගැනීම කරන අතර පිරිවැටුම් බදු පැනවීමක් සිදු නොවේ.

2020 වර්ෂයට ඉලක්කගත කළ හිඟ පිරිවැටුම් බදු ආදායම වන රු.500,000/- ක් වූ අතර එම ඉලක්කය අභිබවා 2020 වර්ෂය තුළ රුපියල් **1,434,800.00** ක් රැස් කරගැනීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. හිඟ බදු අයකරගැනීමේ කටයුතු වලදී ගන්නා ලද අධිකරණමය ක්‍රියාමාර්ග වලදී දෙපාර්තමේන්තු නිලධාරීන් දැක්වූ මහත් කැපවීම මේ සඳහා බෙහෙවින් ඉවහල් වී ඇත.

මුළු හිඟ පිරිවැටුම් බදු ශේෂය 2020 වසරේදී රු. 20,369,362/= ක් දක්වා අඩුකර ගැනීමට හැකි වුණද මෙම ගොනුවල කටයුතු කරගෙන යාමේදී, ව්‍යාපාර ආයතන නොමැති වීම, පුද්ගලයින් නොමැති වීම, පිරිවැටුම් බද්ද අත්හිටුවීමත් සමගම බදු ගෙවීමේ අනුකූලතාවය අඩු වීම යන කරුණු මත හිඟ පිරිවැටුම් බදු අයකර ගැනීම ඉතාමත් අසීරු කාර්යයක් වී ඇත.

### ඇ) ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 4ක් එකතු කිරීම

2020 වර්ෂයේ ඉලක්කගත ඛනිජ අයිතීන් පිළිබඳ බදු ආදායම වන රු.4,000,000/- ක් වුවද රැස්කරගත හැකිවූ ඛනිජ බදු ආදායම රු. 2,878,811/-කි. කොවිඩ් වසංගතය හමුවේ වරින් වර රට වසා දැමීම නිසා ව්‍යාපාරික කටයුතු අඩාල වීමත්, රටේ සංවර්ධන කටයුතු වල පැවති මන්දගාමී ස්වභාවය, ඛනිජ කැනීමේ දැඩි සීමා පැනවීමත්, ඛනිජ ද්‍රව්‍ය කැනීමේ බලපත්‍ර නිකුත් කිරීමේ ස්වභාවය අනුව වසර පුරා අඛණ්ඩව ව්‍යාපාර කටයුතු සිදු නොවීමත්, කාලගුණ විපර්යාස වල දැඩි බලපෑමත් යන කාරණා මත ඛනිජ බදු ආදායම ද අපේක්ෂිත ඉලක්කය කරා ළඟාවීමට නොහැකි වී ඇත.

### ඈ) බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම්

මේ යටතේ දෙපාර්තමේන්තු ඉලක්කය වූ රු. 2,800,000/- අභිබවා 130%ක වර්ධනයක් සමග රු. 3,656,000/-ක බලපත්‍ර හා ලියාපදිංචි ගාස්තුවක් එකතු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. ලෝක රන් මිල වැඩිවීමත්, රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ණය පොලී අනුපාත අඩුකිරීම හා ආර්ථික ගැටළු හේතුකොටගෙන රන් භාණ්ඩ උකස් කිරීම් වැඩිවීමත් යන කරුණු නිසා බඩු උකස්ගන්නා ව්‍යාපාර වල යම් පිබිදීමක් සිදුව ඇති අතර අළුතෙන් ව්‍යාපාර ඇරඹීමේ ප්‍රවණතාවයක් ද දක්නට ලැබේ. මේනිසා ඉදිරි කාලයේදී වාර්ෂික බලපත්‍ර ගාස්තු වල වර්ධනයක් අපේක්ෂා කල හැකිය.

### ඉ) නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

පහත සඳහන් යෝජනා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර,මෙතෙක් අනුමත වී නොමැත.

1. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
2. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව
3. කාර්තුවක පිරිවැටුම රු.මිලියන 30 ට අඩු ව්‍යාපාර සඳහා පිරිවැටුම් බද්ද

### ඊ) වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

- 2020 වර්ෂය තුළ දී නිරෝධායන නීති යටතේ පිරිස් එක්රුස්වීම් සීමාකර තිබීම හේතුවෙන් පුහුණු වැඩමුළු නොපවත්වන ලදී.

### උ) තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය

- Web-based පරිගණක වැඩසටහනක් හා E-file Management System එකක් සෑදීමේ කටයුතු අවසන් කර ක්‍රියාවට නංවා ඇත.
- නව පරිගණක වැඩසටහන සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල සම්බන්ධ කිරීම සිදු කර ඇත.

### ඌ) තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

- නව Web-based පරිගණක වැඩසටහනට ගැලපෙන සේ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය නවීකරණය කර යාවත්කාලීනව පවත්වාගෙන යාමෙන් ආකෘති පත්‍ර හා දැන්වීම් මඟින් බදු ගෙවන ජනතාව දැනුවත් කිරීමටත් අවශ්‍ය ආකෘති පත්‍ර බාගත කරගැනීමටත් අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.

## 2020 ක්‍රියාකාරි සැලැස්ම සැලසුම අනුව කාර්ය සාධනය

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ළඟාවීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය රු.මිලි.1550 | **ආදායම රු.මිලයන** | **1,550** | **1,392** |
| | | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම | 26000 | 7987 |
| | | 2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස්කිරීම හා බැංකු මගින් ලැබෙන තොරතුරු | | 23824 |
| | | 3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරීම | | 7987 |
| | | 4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරීම | 8500 | 4125 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම. | 8500 | 4125 |
| | | 6. ගොනු විශ්ලේෂණය කිරීම.(ආකෘති පත්‍ර 300,101 හා 190 මගින්) | 9000 | 9061 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | |
| | | 8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරීම. | | |
| | | ii. මතය ලබා දීමේදී සහ ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම | රු.මිලි.60 | රු.මිලි.60.6 |
| | | iii. දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ස්ථාන පරීක්ෂණ සංඛ්‍යාව. | 250 | 221 |
| | | iv. සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවීම් ගොනු සංඛ්‍යාව | 5000 | 3533 |
| | | 9. තක්සේරු දැන්වීම් නිකුත් කිරීම සහ තක්සේරු සහතික (මත) නිකුත් කිරීම | 1500 | 1204 |
| | | 10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල) | | |
| | | 11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 30 | 1 |
| | | 12. තොරතුරු නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 50 | 6 |
| | ඛනිජ අයිතීන් පිළිබඳ බදු අංශය රු.මිලි.4 | **ආදායම රු.මිලයන** | **4,0** | **2,8** |
| | | 1. ඛනිජ බදු වාර්තා නිකුත් කිරීම | 4000 | 4400 |
| | | 2. වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරීම | 2000 | 606 |
| | | 3. ලිපිගොනු ආවේක්ෂණය කිරීම | 1500 | 1100 |
| | | 4. තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරීම | 50 | 8 |
| | | 5.ඛනිජ බදු ගෙවීම්පත් දත්ත පරිගණක ගත කිරීම | සියල්ලම | සියල්ලම |
| | | 6. වාර්තා නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 25 | 12 |
| | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය - ගාස්තු හා තැන්පතු රු.මිලි. 2.8 | 1. වාර්ෂික බලපත්‍ර ගාස්තු | **රු.මිලි. 2.8** | **රු.මිලි.3.65** |
| | අය හා හිඟ බදු අංශය<br><br>හිඟ පිරිවැටුම් රු.මිලි. 0.5 | 1. අභියාචනා /විරෝධතා විසඳීම<br>ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම | සියල්ලම | |
| | | 2. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු/ ගාස්තු එකතු කිරීම (D 7) | 250 | 55 |
| | | 3. නොගෙවූ හා එකඟතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම. | 25 | 4 |
| | | 4. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරීම | සියල්ලම | සියල්ලම |
| | | 5. අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම | | |

| | | | | |
|---|---|---|---|---|
| | තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීම් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් එළ කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4. වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | | දැනුවත් කිරීමේ දැන්වීම් පුවරු සකස් කර ප්‍රදර්ශනය කර ඇත |
| 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සම්භාව්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.<br>3. ක්‍රියාත්මක කිරීමට, වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම.<br>4. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනා අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම<br>5. ක්‍රියාත්මක කිරීම | 1 | දැනටමත් ඉදිරිපත් කර ඇත |
| 3. ධාරිතා සංවර්ධනය | කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනාගැනීම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම.<br>3. සම්පත් දායක පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනීම.<br>4.පිරිවැය හඳුනාගැනීම. | | |
| | තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය | 1. කාර්යක්ෂම, ආරක්ෂාකාරී තොරතුරු පද්ධතියක් සැකසීම<br>2. කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම<br>3. Web Base පරිගණක වැඩසටහනක් සැකසීම | | ක්‍රියාවට නංවා ඇත |
| 4. යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | | සාර්ථක මට්ටමේ පවතී |

ඉහත සියලුම දත්තයන් නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්ෂා කිරීමෙන් ලබාගෙන ඇති අතර ඒ අනුව ඉහත වගුව සකස්කර ඇත.

## 2.2 විශේෂ ජයග්‍රහණ

2020 වසරේදී පැවති, 2018 ගිණුම් වර්ෂයට අදාල රාජ්‍ය ආයතනවල මූල්‍ය කළමනාකරණය සහ කාර්යය සාධනය පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් සිදුකරනු ලැබූ ඇගයීම් ක්‍රියාවලියේ දී මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට කුසලතා සහතිකයක් හිමිවීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි.

## 2.3 ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

2020 වර්ෂයේදී ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ සැලසුම් කරන ලද ක්‍රමෝපායන් අනුව කාර්යාලයීය කටයුතු ඉටු කිරීමට උපරිම උත්සාහයක් දරන ලදී.

**අභියෝග**

රටේ පැවති අස්ථාවර දේශපාලනික හා ආර්ථික වාතාවරණය නිමාවට පත් කරමින් රට යථා තත්වයට පැවතෙමින් තිබූ අවස්ථාවේ දී මුහුණපෑමට සිදුව ඇති කොවිඩ්19 ගෝලීය වසංගතය හමුවේ රටේ ආර්ථිකය පසුගිය වසරටත් වඩා පසුබෑමට ලක්ව ඇත. 2020 මාර්තු මස 13 වන දින සිට මාස දෙකහමාරක කාලයක් රට වසා දැමීම හා ඉන් අනතුරුවද සංචරණ සීමා ක්‍රියාත්මක වීම නිසා බදු ගෙවන්නන් සම්මුඛ සාකච්ඡා කැඳවීම, දේපළ ස්ථාන සමීක්ෂණ සිදුකිරීම, නඩු පැවරීම් ප්‍රමාණය සීමා කිරීම වැනි රාජකාරි කටයුතු දැඩි ලෙස සීමා කිරීමට සිදුවීම නිසා බදු හා ගාස්තු එකතුකිරීමේ ක්‍රියාවලියද වෙනසකට භාජනය කරමින් බොහෝ බාධාවන් මධ්‍යයේ වුව ද කරගෙන යාමට සිදුවිය. කොවිඩ්19 වසංගතය හමුවේ ආර්ථික අපහසුතාවයට පත් මහජනතාවට රජය මගින් මූල්‍ය පහසුකම් මෙන්ම අනෙකුත් සහන ද ලබා දෙන වාතාවරණයක් තුල බදු හා ගාස්තු එකතු කිරීමේ ක්‍රියාවලියද අභියෝගයට ලක්ව ඇත. මෙම අභියෝගයට සාර්ථකව මුහුණදෙමින් රුපියල් මිලියන 1,400 ක ආදායමක් පළාත් සභාවට රැස්කර දීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. එහිදී පළාතේ මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලීසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු කාර්යය මණ්ඩලයෙන්, ප්‍රධාන ලේකම්තුමා ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය එසේ වුව ද, 2021 වර්ෂය සඳහා අයවැය මගින් ලබාදී ඇති මුද්දර ගාස්තු ආදායම් ඉලක්කය 2020 වර්ෂයට සාපේක්ෂව 125%ක වැඩිවීමකි. මෙය කිසිසේත්ම ප්‍රායෝගික නොවන හා කිසිදු පදනමක් නොමැතිව ලබා දී ඇති ඉලක්කයක් බව ද පෙන්වා දෙමි. එසේ වුවද, පසුගිය වර්ෂවල මෙන්ම, 2020 වසරේ දී ලද අත්දැකීම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින්, නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති වලට යටත්ව, එමෙන්ම කොවිඩ්19 වසංගතය යටතේ නව සාමාන්‍යකරනයට සාර්ථකව මුහුණ දෙමින්, ලබා දී ඇති ආදායම් ඉලක්ක අභිබවා යමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දීම අපගේ ඒකායන අරමුණයි.

**ස්තුතියි,**

(එච්. කේ. අජන්තා පෙරේරා)
පළාත් ආදායම් කොමසාරිස්
මධ්‍යම පළාත